## <u>වටී වටී ඔබ නිසා වටී</u>

කපිල පීරිස් මහතා මා නිවන හිතුමතේ විවරණය කරන්නේ ය යනුවෙන් කරන ප්‍රකාශයට පසුව පිළිතුරු දෙමි. එහෙත් පාඨකයනට ඒ පිළිබඳ එතෙක් සිතීම සඳහා ඔහු කියා ඇති කරුණු මුළුමනින් ම සඳහන්කිරීම වැදගත් වෙයි. පිළිතුර දීර්ඝ වුව ද උපුටා දැක්වීම අවශ්‍ය ය. මගේ පිළිතුරෙහි මෙවර කොටසට ද එහි වැදගත්කමක් වෙයි. කපිල පීරිස් මහතා සැප්තැම්බර් 23 වැනි දා ලිපියෙහි මෙසේ කියයි. “බටහිරයනට සැබෑ ගැටලුව වන්නේ අප අපේ ඉංජිනේරු (සංවර්ධන) සම්ප්‍රදායට යොමු වීම ය. එම සම්ප්‍රදායට අදාළ දැනුම ප්‍රධාන වශයෙන් සැපයෙන්නේ භෞතික සිද්ධීන් හා සබැඳුණු අපේ ප්‍රවාදවලින් නොව බටහිර චින්තනයෙන් මිදුණු බුද්ධදහමෙනි. ඉතින් අපේ දාගැබක ව්‍යුහය නිව්ටන් නියමවලින් පැහැදිලි කර දීම, අපේ දැනුම බන්දේසියක තබා බටහිරයන්ට දීමක් වන්නේ කෙසේ ද? එම විග්‍රහය ඔවුනට කොහොමත් සංවේදී ය. ඔවුනට සංවේදී නො වන්නේ අපේ බුද්ධදහම පසුබිම් කරගත් පෙර කී දැනුම ය. අප ඇත්තට ම පරෙස්සම් විය යුත්තේ එවා විවරණය කිරීමේ දී ය. බුද්ධදහම හිතුමතේ විවරණය කරන නලින් ද සිල්වා මහතා නිව්ටන් නියමවලින් දාගැබක් විවරණය කිරීම කෙරෙහි විස්සෝප වීම අපට සිතාගත නොහැකි ය.”

කපිල පීරිස් මහතා අපේ ඉංජිනේරු සම්ප්‍රදායක් ගැන කියයි. එය සංවර්ධන සම්ප්‍රදායක් බවක් හැඟෙයි. ඒ ගැන පසුව කතා කරමු. ඒ කුමක් වුවත් එයට අදාළ ප්‍රධාන දැනුම සැපයෙන්නේ බුද්ධදහමෙන් යැයි කියන ඒ මහතා දාගැබක ව්‍යුහය නිව්ටෝනීය නියමවලින් පැහැදිලි කිරීමට බටහිරයන් සංවේදී බව පවසයි. එහෙත් බුද්ධදහම පසුබිම් කරගත් දැනුමට බටහිරයන් සංවේදී නොවන බවත් අප පරෙස්සම් විය යුත්තේ එවා විවරණය කිරීමේ දී බවත් පවසයි. ඔහු බුද්ධදහම හිතුමතේ විවරණ කරන නලින් ද සිල්වා දාගැබක් නිව්ටෝනීය නියමවලින් විග්‍රහකිරීම ගැන විස්සෝප වීම සිතාගත නොහැකි බව කියන්නේ ඉන් පසුව ය. කපිල පීරිස් මහතා කෙලින් ම නොකීවාට ඔහු කියන්නේ මා බුද්ධදහම හිතුමතේට බටහිරයන්ට සංවේදී වන අයුරින් විවරණය කරන බව ද? මේ සංවේදී වීම යන්නෙන් කපිල පීරිස් මහතා අදහස් කරන්නේ කුමක් ද යන්න ද පැහැදිලි නැත. කෙසේ වෙතත් කපිල පීරිස් මහතා කියන්නේ මා බටහිර ප්‍රවාද නියම ආදිය යොදාගෙන බටහිරයන්ට තේරෙන අයුරින් බුද්ධදහම හිතුමතේට විවරණය කරන බව ද? ඒ එසේ නම් ඒ මහතා පසුගිය අවුරුදු විසිපහක පමණ කාලයක් තිස්සේ මා ලියා ඇති ලිපි තේරුම් ගෙන නොමැති බව පැහැදිලි ය. මට අවශ්‍ය කරන්නේ සිංහල බෞද්ධ චින්තනයෙහි බුද්ධදහම තේරුම් ගැනීම මිස බටහිරයන්ට හෝ බටහිරයන් අනුකරණය කරන්නන්ට හෝ තේරෙන අයුරින් බුද්ධදහම විවරණය කිරීම නො වේ. මා කියන ඇතැම් දේ මෙයට පෙර කිසිවකු කියා නැත්නම් එහි වරද මා අත නො වේ. මට අද පෙනෙන දේ විවිධ පුද්ගලයන්ට එදා නොපෙනීම නිසා මා අද අලුතින් යමක් නොකිව යුතු ද? අනෙක් අය අතීතයේ දී ලියා ඇති දේ කියවා එවා නැවතත් ලිවීම උගතුන්ගේ කාර්යය විය හැකි ය. මම උගතෙක් නො වෙමි. බුද්ධදහම හා එහි විවරණ පිළිබඳ ව වැඩිදුර කතාකිරීමට පෙර පාඨකයනට කල්පනා කිරීමට ප්‍රශ්න දෙකක් පමණක් ඉදිරිපත් කරමි. (i) නිවන් අවබෝධ කරන්නේ මනසින් ද? (ii) පිරිනිවන් පෑමෙන් පසුව මනස පවතී ද?

කලින් සඳහන් කළ ලිපියෙහි ම කපිල පීරිස් මහතා මෙසේ කියයි. “අප ගේ අරමුණ  වන්නේ . .. .. බටහිර ඉංජිනේරු සම්ප්‍රදායට එරෙහි ව අප ගේ ඉංජිනේරු සම්ප්‍රදාය (එය ජීවන ක්‍රමයකි) එළි පෙහෙළි කර ගැනීම ය. මේවා එළි පෙහෙළි වීම ඇරඹෙන්නේ බ්‍රෝහියර්, පාකර් වැනි වියතුන්ගෙනි. ඩී. එල්. ඕ. මැන්ඩිස් වැනි වියතුන් මගින් මේවා තවදුරටත් එළි පෙහෙළි විය. පසුව කී මහතුන් මගින් මේවා හුදු ඉංජිනේරු තාක්ෂණික වැඩ ලෙස පමණක් නොව එවා සමග සබැඳුණු අප ගේ ජීවන ක්‍රමය පිළිබඳ ව ද කියැවිණි. වත්මන් පරපුර මේවා පිළිබඳ ව දැනගන්නේ එතුමන් ලා ලබා දුන් එම අත්වැල උපයෝගී කර ගෙන ය. එහෙත් මෙතෙක් මේ සියලු ම දේවල්, මේවායේ ක්‍රියාකාරීත්වයන් පිළිබඳව විග්‍රහ කළේ දැන හෝ නො දැන හෝ නිව්ටන් ගේ ලෝකයේ සිට ය. නිව්ටෝනීය යාන්ත්‍රිකයක් හෝ එවැන්නක් පිළිබඳව අබමල් රේණුවක තරමින් හෝ නොදන්නා අපට හමු වී ඇති හද්දා පිටිසර ගැමියන් පවා මේවා විස්තර කරන්නේ ඉතා පැටලිලි සහිතව හෝ එම සංකල්ප භාවිතයෙනි.”

කපිල පීරිස් මහතා අනුගමනය කරන්නේ බ්‍රෝහියර්, පාකර්, මැන්ඩිස් මහත්වරුන් ය. මේ මහත්වරුන්ගෙන් අපේ ජීවන ක්‍රමය ගැන ද කියැවී ඇතැයි කපිල පීරිස් මහතා කියයි. ඒ මහතා කියන ඉංජිනේරු සම්ප්‍රදාය ජීවන ක්‍රමයක් ද වෙයි. එහෙත් මේ ජීවන ක්‍රමය දැනගත්තේ පැරණි වැව් හා දාගැබ් ගැන ඉංජිනේරුවන් කිහිප දෙනකු විසින් නිව්ටෝනීය සංකල්ප යොදා ගනිමින් කරන ලද විස්තර කිරීම් නිසා ද? කිසිසේත්ම නැත.මේ ජිවන ක්‍රමය නිව්ටෝනීය සංකල්ප ගැන

© Prof. Nalin De Silva

නොදත්, ඉංජිනේරුවන් නොවන්නන් විසින් හෙළි පෙහෙළි කෙරී ඇති අතර ඉංජිනේරුවන් කිහිප දෙනකු කර ඇත්තේ ඒ ජීවන ක්‍රමය ඔස්සේ වැව් ගැන කතා කිරීම ය. අපේ පැරණි ජීවන ක්‍රමය ගැන කතා කළ අයට නිව්ටෝනීය සංකල්ප දත් ඉංජිනේරුවන්ගෙන් ලැබුණු විශේෂිත දැනුම කුමක් ද? මගේ පියා නිව්ටන්ගේ බලය යනු කුමක් දැයි මිය යන තුරුම නො දැන සිටියේ ය. එහෙත් ඔහු වැව්යි දාගැබයි හා බැඳුණු අපේ පැරණි ජීවන ක්‍රමය ගැන යම් පමණකින් දැන සිටියේ ය. ඒ මගේ පියාට වක්‍රව වුවත් බ්‍රෝහියර්ලා ගෙන් ලැබුණු දැනුමක් නිසා නො වේ. මා වැව්යි දාගැබයි අගය කළේ නිව්ටෝනීය බලය ගැන හෝ බ්‍රෝහියර් ගැන හෝ මෙලෝ හසරක දැනුමක් නැතිව ය. (පසු කලෙක මා තේරුම් ගත්තේ නිව්ටන්ට ද බලය ගැන පැහැදිලි තේරුමක් නොවූ බව ය.) ඉංජිනේරුවන්ට අපේ ජීවන ක්‍රමය ගැන කියා දී ඇත්තේ ඉංජිනේරුවන් නොවන අය මිස නිව්ටෝනීය සංකල්ප නො වේ. මෙරට කී දෙනකු ඩී එල් ඕ මැන්ඩිස් මහතා ගැන අසා තිබේ ද? එසේ අසා ඇති අය අතරින්  කී දෙනෙක් ඔහු කර ඇති වැඩ ගැන සෘජුව හෝ වක්‍රව හෝ  දනිත් ද? මැන්ඩිස් මහතා අපේ පැරණි ජීවන ක්‍රමය ගැන නිව්ටෝනීය සංකල්ප යොදාගෙන අලුතෙන් එකතු කර ඇති දැනුම කුමක් ද? (මෙහි දී වැදගත් වන්නේ නිව්ටෝනීය සංකල්ප යොදාගනිමින් එකතු කළ දැනුම බව අවධාරණය කළ යුතු ය.) ඒ දැනුම කිනම් ආකාරයකින් ජනතාව අතරට ගොස් තිබේ ද?

කපිල පීරිස් මහතා ඉහත සඳහන් කරුණ අවධාරණය කරමින් මෙසේ ද සඳහන් කරයි. ‘‘නිව්ටන්ගෙන් පරිබාහිරව සිට මේවා පිළිබඳව යමක් සඳහන් කළ හැකි කිසිවකු අපට තවම හමු වී නැත. (එහෙත් එවැන්නන් සිටිනවා විය හැකි ය) කවුරුන් මොනවා කීවත් පවතින තත්වය එයයි. කෙසේ වුවත් බ්‍රෝහියර්ලා, පාකර්ලා ගෙන් පසුව අපේ වියතුන් මේවා පිළිබඳ ව විග්‍රහ කොට එවායේ වැදගත්කම එළිපෙහළේ කිරීම, ‘මේවා නිව්ටන්ගේ ලෝකයේ සංකල්ප මගින් පැහැදිලි කිරීම යෝග්‍ය නො වේ’ යැයි කියා පසෙකට දැමුවේ නම් අද අපට අපේ ඉංජිනේරු සම්ප්‍රදායක් පිළිබඳව කතා කිරීමට වුව දෙයක් ඉතිරි වන්නේ නැත. සියල්ල නූතන සංවර්ධන රැල්ලෙන් (ඉංජිනේරු සම්ප්‍රදායෙන්) අතුගෑවී ගොස් කෞතුක වස්තූන් ලෙස කෞතුකාගාරවල පමණක් රැඳෙනු ඇත. අද මේවා මෙපමණින් හෝ රැඳී ඇත්තේ අද ඉතා ප්‍රචලිතව ඇති මෙම නිව්ටෝනීය සංදර්භය තුළින් ම මේවායේ වැදගත්කම පෙන්වා දී ඇති නිසා ය.’’

පළමුවෙන් ම කපිල පීරිස් මහතා මට හීං ටොක්කක් අනියි. නිව්ටන්ගෙන් පරිබාහිරව මේවා ගැන කිසිවක් කළ අයකු ඔහුට තවම හමුවී නැතැයි ඔහු කියන්නේ මා ගැන හෝ අපේ ප්‍රවාද නිර්මාණය ගැන කතාකරන මගෙන් යමක් උගත් අය ගැන හෝ වෙයි. ලංකාවේ වෙනත් පුද්ගලයන් බටහිර ප්‍රවාදවලින් පරිබාහිරව මේවා ගැන නොසිතන බව කපිල පීරිස් මහතා අවංක පුද්ගලයකු නම් පිළිගන්නවා ඇත. එසේ සිටින්නේ දැයි තමා නොදන්නා බව ඒ මහතාට කිව හැකි ය. තර්කය සඳහා එසේ කිව හැකි වුව ද ඒ උගුරට හොරා බෙහෙත් කැමකි. පිටරැටියන් ගැන කතාකිරීම තේරුමක් නැති දෙයකි. කවුරු මොනවා කීවත් යන්නෙන් කපිල පීරිස් මහතා තම ටොක්ක යුක්ති යුක්ත කරයි.  කපිල පීරිස් මහතා කියන්නේ ඇත්තකි. ඉංජිනේරු ශිල්පයෙහි අපේ ප්‍රවාද නිර්මාණය කිරීමට මා සමත් වී නැත.

මම ඉංජිනේරුවෙක් නො වෙමි. එපමණක් නො වේ. මම ඉංජිනේරු තාක්ෂණය ප්‍රිය නො කරමි. එවැනි ක්ෂෙත්‍රයක අපේ ප්‍රවාද නිර්මාණය කිරීමට මට නො හැකි ය. එහෙත් මා ප්‍රිය කරන ක්ෂෙත්‍රවල මා අතින් අපේ ප්‍රවාද නිර්මාණය වී ඇත. විදුසර පුවත්පතේ පළවන්නේ එවැනි ප්‍රවාද ය. ඒ ගණිතය, සෛද්ධාන්තික භෞතික විද්‍යාව, දේශපාලනය, දර්ශනය, ඉතිහාසය, පුරාවිද්‍යාව, සාහිත්‍යය, සමාජ විද්‍යාව, බුදුදහම (අර්ථකථන යන තේරුමෙන්) ආදී විෂය සම්බන්ධයෙන් වෙයි. මෙරට සන්තතික දෙමළ ඉතිහාසය ලන්දේසි යුගයෙන් ඈතට නොයන බව පෙන්වීමට අපි සමත් වීමු. ලන්දේසීන් විසින් ගෙන්වන ලද වෙල්ලාලයන් මෙරට ජීවත්වූ දෙමළ ජනතාවක් අතර ගිලී ගියා නොව, එවැනි දෙමළ ජනතාවකට අවශෝෂණය වුවා නොව, යාපනයේ සිටි සිංහලයන්, මලයාලම් කතාකළ වේලක්කාරයන් හා දෙමළ කිහිප දෙනකු වෙල්ලාලයන් අතර ගිලා බැස ඇති බව පෙන්වීමත් සමග මෙරට දෙමළ සන්තතික ඉතිහාසය ලන්දේසි යුගයෙන් පසුව ඇරඹි බව පෙන්වීමට අපි සමත් වීමු. ඒ ප්‍රවාදය මහාවංසය ද නැවත විවරණය කිරීමෙන්, එහෙත් මහාවංස සම්ප්‍රදාය මත ගොඩ නැගුණු එකකි. මේ කරුණු දි අයිලන්ඩ් පුවත්පතෙහි කිහිප වතාවක් ම පළ වී ඇති නමුත් මෙතෙක් කිසිම දෙමළ අයකු ඒ පිළිබඳව අභියෝගයක් කර නැත. කපිල පීරිස් මහතාට අවශ්‍ය නම් බුද්ධිමත් ජනයා හිතුමතේ කරන විවරණවලට අභියෝග නොකරන්නේ යැයි කිව හැකි ය. එයට අමතරව ආදිවාසියා යන්න වැදි ජනයාට පමණක් යෙදීමට නොහැකි බවත් සිංහලයන් ද පැරණි ගෝත්‍ර සම්බන්ධතා මත ආදීවාසීන් බවත් අපි පෙන්වා දුනිමු. අප විසින් අපේ ප්‍රවාද ලිපි පෙළ ඔස්සේ පමණක් ගොඩ නගන ලද ප්‍රවාද රාශියක් වෙයි. ඒ සියල්ල නැවතත් මෙහි දැක්වීමට නො හැකි ය. ඉංජිනේරු තාක්ෂණයෙහි අප ප්‍රවාද ගොඩනගා නැත්තේ අදාළ ක්ෂෙත්‍රය මගේ විෂය

© Prof. Nalin De Silva

පථයෙන් බැහැරව තිබෙන බැවිනි. මහාවංසය ඒ සම්ප්‍රදායෙහි හිඳිමින් නැවත විවරණය කරන්නාක් මෙන් බුදුදහම පිළිබඳ විවරණ ද සිංහල ථෙරවාද සම්ප්‍රදායෙහි හිඳිමින් නැවත විවරණය කිරීමට මම පසුබට නො වෙමි. අටුවා ලියා ඇත්තේ රහතන් වහන්සේලා නො වේ. අපට ද අලුතෙන් අටුවා ලිවීමේ බාධාවක් නැත. මා ලියා ඇති කිසිවකින් මා දන්නා ථෙරවාද බුද්ධදහමට ප්‍රශ්නයක් වී නැත.

කපිල පීරිස් මහතා ඉහත සඳහන් ඡේදයෙහි දිගින් දිගට ම මේවා යන්න සඳහන් වෙතත් ඒ කුමක් දැයි පැහැදිලි නැත. මේවා යනු ඒ මහතා කියන "අප ගේ ඉංජිනේරු සම්ප්‍රදාය" ද? එසේ නම් ඒ කුමක් ද? කෙසේ වෙතත් ඒකවචන වූ සම්ප්‍රදාය යන්න මේවා නමින් බහුවචන විය නො හැකි ය. මේවා යනු වැව් දාගැබ් ආදී නිමැයුම් විය යුතු ය. කපිල පීරිස් මහතා ඩී එල් ඕ මැන්ඩිස් මහතා ආදීන් අනුව යමින් කරන්නේ මේ නිර්මාණ නිව්ටෝනීය සංකල්පවලින් විස්තර කර "අප ගේ ඉංජිනේරු සම්ප්‍රදාය" එළි පෙහෙළි කර ගැනීම ය. කපිල පීරිස් මහතාට අනුව මේ නිර්මාණ නිව්ටෝනීය සංකල්ප මගින් පැහැදිලි කිරීම යෝග්‍ය නොවේ යැයි කියා පසෙකට දැමුවේ නම් අද ඒවා කෞතුකාගාරවල පමණක් රැඳෙනු ඇත. වැව් හා දාගැබ් අද ඉතිරිව ඇත්තේ බ්‍රෝහියර්ලා ඒවා නිව්ටෝනීය සංකල්පවලින් තේරුම් ගත් බැවිනි! මෙයටත් වඩා විහිළුවක් තවත් තිබිය හැකි ද? රුවන්වැලි සෑය ප්‍රතිසංස්කරණය කෙළේ දැනට දශක කිහිපයකට ඉහත දී ය. ඒ ප්‍රතිසංස්කරණය කර "කෞතුකාගාරයෙන් එළියට" ගන්නා විට එහි ගතිකත්වය හෝ වෙනත් යමක් නිව්ටෝනීය සංකල්පවලින් තේරුම් ගෙන තිබිණි ද? ඒ ඔස්සේ "අප ගේ ඉංජිනේරු සම්ප්‍රදාය" දැනගෙන තිබිණි ද? අවුරුදු හැත්තෑවකට අසූවකට පෙර රුවන්වැලි සෑය තිබුණේ කඩා වැටුණු දාගැබක් ලෙස ය. එයට සිංහල බෞද්ධයන් අතර එකල ද වැදගත්කමක් ලැබුණේ නිව්ටෝනීය සංදර්භයෙහි එහි වැදගත් කමක් පෙන්වා දී තිබූ නිසා නොව ඒ දාගැබ අපේ මහා දාගැබ බවට පුරාවිද්‍යාඥයන් හා අනෙක් අය හඳුනාගෙන තිබූ බැවිනි. නිව්ටෝනීය සංකල්පවලින් තේරුම් ගතත් නැතත් රුවන්වැලි සෑය අපට ගැමුණු රජතුමා කර වූ මහා සෑය ය. ඒ සෑය අපට වටියි. ශ්‍රී මහා බෝධීන් වහන්සේ හා දන්ත ධාතුන් වහන්සේ අපට වටින්නේ නිව්ටෝනීය සංකල්පවලින් බැරිනම් නිව්ටෝනීය සංදර්භයෙහි උන්වහන්සේලාගේ වැදගත්කම පෙන්වා දී ඇති නිසා ද? නිව්ටෝනීය සංකල්ප, නිව්ටෝනීය සංදර්භය, නිව්ටෝනීය සුසමාදර්ශය යකාට ගියත් අපට ඒ වස්තූන් වටින්නේ ඒ අපේ ඉතිහාසය නිසා ය. ඒ අපේ වර්තමානය නිසා ය. ඒ අපේ අනාගතය නිසා ය. ඒ අපේ ජීවන සම්ප්‍රදාය සමග බැඳුණු නිසා ය. නිව්ටන් ඇතත් නැතත් අපි ඒ "කෞතුකාගාරවල" තැන්පත් වස්තු ලෙස නො සලකමු. අපට එහි ඇති වැදගත්කමක් තේරුම් ගන්නට නිව්ටන් අවශ්‍ය නො වේ. කපිල පීරිස් මහතා නම් ජනප්‍රිය ගීතයක් සංශෝධනය කර නිව්ටන්ගේ ඡායාරූපයක් අබියස දණින් වැටී හෝ නොවැටී හෝ කියනු ඇත්තේ කලාවැවෙන් ගත් දිය දෝතක් මට වටී වටී ඔබ නිසා වටී කියා ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva